කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය

ව්‍යාපාර කළමනාකරණවේදී (සාමාන්‍ය) උපාධි පළමු පරීක්ෂණය (බාහිර) - 2014

මාර්තු - 2019

**BMGT E1035 - ව්‍යාපාර ආර්ථික විද්‍යාව**

ප්‍රශ්න සංඛ්‍යාව : I කොටස - 10 | කාලය : පැය 03 යි

II, III කොටස - 06

**පළමු කොටස ඇතුළුව ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න. පළමු කොටසට පිළිතුරු සැපයීම අනිවාර්ය වේ. II කොටස සහ III කොටසින් අවම වශයෙන් එක් ප්‍රශ්නයක්වත් තෝරාගන්න.**

<u>I කොටස</u>

<u>වඩාත්ම ගැලපෙන පිළිතුර යටින් ඉරක් අඳින්න.</u>

01. ආර්ථික විද්‍යාව යනු,

a) නිෂ්පාදන තාක්ෂණය

b) පරිභෝජන තීරණ

c) වෙළඳපොල ව්‍යුහයන්

d) සමාජය පාලනය කළ හැකි හොඳම ක්‍රමය පිළිබඳ හැදෑරීම වේ.

02. පහත ප්‍රකාශ වලින්කුමක් අසත්‍ය වේද?

a) හිඟකම සියලු ආර්ථිකයන් සඳහා බලපානු ලැබේ.

b) මූලික ආර්ථික ගැටළුව යනු විකල්පයන් අතරින් එකක් තෝරා ගැනීමකි.

c) නිෂ්පාදන සාධකවල සැපයුම සීමිතය.

d) සීමිත පාරිභෝගික උවමනාවන් නිසා තෝරාගැනීම අත්‍යාවශ්‍යයෙන් සිදුකල යුතුය.

03. භාණ්ඩයක් සඳහා වන ඉල්ලුම් වක්‍රය විතැන් වීමක් සිදු නොවිය හැක්කේ පහත අවස්ථාවලින් කුමන අවස්ථාවකදී ද?

a) පාරිභෝගික ආදායම් වෙනස්වීම.

b) භාණ්ඩයේ මිල වෙනස් වීම.

c) අනුපූරක භාණ්ඩයක මිල වෙනස් වීම.

d) ඉහත සියල්ලම නිසා ඉල්ලුම් වක්‍රය විතැන් වේ.

04. රජය විසින් භාණ්ඩයක් සඳහා උපරිම මිලක් නියම කරන විට, පහත වගන්ති සම්බන්ධයෙන් කවර වරණයක් සත්‍ය වේද?

i. ඉල්ලුමෙහි ඉහළ යාමක්

ii. සැපයුමෙහි ඉහළ යාමක්

iii. භාණ්ඩ වල හිඟයක්

a) I පමණි

b) I සහ II පමණි

c) I සහ III පමණි

d) III පමණි

05. පොල් වල ඉල්ලුම් ශ්‍රිතය සහ සැපයුම් ශ්‍රිතය $Qd= 300-6p$ සහ $Qs= 20+8p$ වේ. පොල් ගෙඩියක මිල රු.15ක් වනවිට පොල් වෙළඳපලේ,

a) සමතුලිතයක් ඇති වේ.

b) අධි ඉල්ලුමක් ඇති වීම නිසා මිල ඉහළ යයි.

c) අධි ඉල්ලුමක් ඇති වීම නිසා මිල පහළ යයි.

d) අධිසැපයුමක් ඇති වීම නිසා මිල ඉහළ යයි.

06. කුටුම්බයන්ගේ වැයකල හැකි ආදායම වනුයේ,

a) ඔවුන් වෙත සංක්‍රාම ලබා දීමටපෙර සහ රජයට බදු ගෙවූ පසු ආදායම

b) ඔවුන් වෙත සංක්‍රාම ලබා දුන් පසු සහ රජයට බදු ගෙවීමෙන් පසු ආදායම

c) ඔවුන් වෙත සංක්‍රාම ලබා දුන් නමුත් සහ රජයට බදු ගෙවීමට පෙර ආදායම

d) ඔවුන් වෙත සංක්‍රාම ලබා දීමට පෙර නමුත් රජයට බදු ගෙවූ පසු ආදායම

07. රැකියා සොයන්නන්ට සුදුසු රැකියා අවස්ථා සොයා ගැනීම සඳහා සහ සේවායන්ට අවශ්‍ය සුදුසු සේවකයන් තෝරාගැනීමට ගතවන කාලය තුල ඇතිවන රැකියා වියුක්තිය හඳුන්වනු ලබන්නේ, සෘතුමය

a) සෘතුමය විරැකියාව ( Seasonal Unemployment)

b) චක්‍රීය විරැකියාව ( Cyclical Unemployment)

c) සර්ෂණ විරැකියාව ( Frictional Unemployment)

d) ව්‍යුහමය විරැකියාව ( Structural Unemployment)

08. යම් ආර්ථිකයක අපනයන රු. බිලියන 40 ක සහ ආනයනය රු. බිලියන 175 ක් වේ.පාරිභෝගික වියදම් රු. බිලියන 2343 දක්වා වැඩිවී ඇති අතර, දළ ආයෝජනය රු. බිලියන 379 ක් සහ රජයේ වියදම් රු. බිලියන 865 කි. එම ආර්ථිකයේ දළ දේශීය නිෂ්පාදිතය වනුයේ,

a) රු. බිලියන 3722 කි

b) රු. බිලියන 3452 ක්

c) රු. බිලියන 3802 ක්

d) ප්‍රමාණවත් සංඛ්‍යා නොමැති නිසා දළ දේශීය නිෂ්පාදිතය ගණනය කළ නොහැකිය

09. 2007 ගණන්වල මුල් භාගයේ දී මහ බැංකුව විසින් සංකෝචන මුදල් ප්‍රතිපත්තියක්ක්‍රියාත්මක කල අතර රජය යුධ වියදම් ඉහළ දමා බදු කපා දැමීය. IS-LM ආකෘතිය මගින් මෙම ප්‍රතිපත්ති මිශ්‍රණයේ පුරෝකථනය කරන ලද ප්‍රතිඵල මොනවාද?

a) නිමැවුම පහත වැටෙනු ඇති අතර පොලී අනුපාත පහත වැටෙනු ඇත.

b) නිමැවුම ඉහළ යන අතර පොලී අනුපාත පහත වැටෙනු ඇත.

c) පොලී අනුපාත මත ඇති බලපෑම අස්ථිර ය, නමුත් නිමැවුම පහතවැටෙනු ඇත.

d) නිමැවුම කෙරෙහි බලපෑම් අවිනිශ්චිත වුවත් පොලී අනුපාත ඉහල යනු ඇත.

10. ප්‍රසාරණය කරන ලද මූර්ත ප්‍රතිපත්තිය මගින්

a) G↑→ AD↑→ IS වක්‍රය වමට විතැන් වේ. → Y ↑→mt↑→msp↓→ r ↑

b) G ↑→ AD↓→ IS වක්‍රය දකුණට විතැන් වේ. →Y ↓→mt↓→msp↑→ r ↑

c) G ↑→ AD ↑→ IS වක්‍රය දකුණට විතැන් වේ. →Y ↑→mt↑→msp↓→ r ↑

d) G ↑→ AD ↑→ IS වක්‍රය දකුණට විතැන් වේ. →Y ↑→mt↓→msp↓→ r ↓

**මුළු ලකුණු (10*2 = 20)**

## II කොටස

**ප්‍රශ්න හතරකට පමණක් (04) පිළිතුරු සපයන්න. එක් කොටසකින් (II කොටස සහ III කොටස) අවම වශයෙන් එක් ප්‍රශ්නයක් තෝරාගන්න.**

ප්‍රශ්න අංක 01

අ. " සූක්ෂම ආර්ථික ප්‍රතිපත්ති සමගාමීව ක්‍රියාත්මක කිරීමකින් තොරව සාර්ව ආර්ථික මූලධර්ම ක්‍රියාත්මක කළ නොහැකියි."

ඉහත දැක්වෙන ප්‍රකාශය සම්බන්ධව, සමාගම්වල මෙහෙයුම් කටයුතු සහ කළමනාකරණ තීරණ ගැනීම සඳහා ව්‍යාපාරික ආර්ථික විද්‍යා න්‍යායන් යෙදිය හැකි ආකාරය කෙටියෙන් විස්තර කරන්න.

**(ලකුණු 06)**

ඇ. මිල ඉල්ලුම් න්‍යායට අදාල වන ව්‍යතිරේකයන් මොනවාද?

**(ලකුණු 04)**

ඈ. පහත දැක්වෙන සමස්ත ආදායම හා සමස්ත පිරිවැය ශ්‍රිතයන් එක්තරා සංවිධානයකට අදාළ වේ

$$TR = 12Q$$

$$TC = 4Q^2 - Q^2 + 10$$

ලාභ උපරිම කරන නිමවුම් මට්ටම ගණනය කරන්න.

**(ලකුණු 04)**

ඊ. ආදායම් මට්ටම රු. 1000 සිට රු. 1200 දක්වා වැඩි වේ. ආයතනයෙහි විකිණුම් ඒකක 5000 සිට 8000 දක්වා ඉහළ ගොස් ඇත . මෙම භාණ්ඩයේ ආදායම් නම්‍යතාවය ගණනය කරන්න.

**(ලකුණු 03)**

ඒ. කෝපි කිලෝවක මිල රු. 65 සිට රු. 70 දක්වා ඉහළ යන විට තේවල විකුණුම් ප්‍රමාණය කිලෝ 4000 සිට කිලෝ 5000 දක්වා වැඩි වේ. මෙම ඉල්ලුමෙහි හරස් නම්‍යතාවය ගණනය කරන්න.

**(ලකුණු 03)**

**(මුළු ලකුණු 20)**

ප්‍රශ්න අංක 02

ඇ. "නිෂ්පාදන ශ්‍රිතය මගින් යෙදවුම් හා නිමවුම් අතර පවතින සම්බන්ධතාවය නිරූපණය කරයි. කෙටි කාලපරිච්ඡේදයකදී අවම වශයෙන් එක් යෙදවුමක්වත් ස්ථාවර වන අතර ආයතනයකට තම නිෂ්පාදනය ඉහළ දැමිය හැකි වන්නේ විචල්‍ය නිෂ්පාදන සාධක යෙදවුම් ප්‍රමාණය වැඩි කිරීමෙන් පමණි." ශ්‍රමික යෙදවුම් ප්‍රමාණය වැඩි කිරීමෙන් සමස්ත නිමවුමට වන බලපෑම පිළිබඳව රූප සටහන් යොදා ගනිමින් පැහැදිලි කර ප්‍රශස්ත නිෂ්පාදන පරාසයදක්වන්න.

(ලකුණු 08)

ආ. "සාමාන්‍ය භාණ්ඩයක මුළු ප්‍රතිවිපාකය ආදායම් හා ආදේශන ප්‍රතිවිපාකයන්ගේ එකතුවකි." ඔබ මෙම ප්‍රකාශය සමග එකග වන්නේද ? ඔබගේ පිළිතුර රූප සටහන් ආශ්‍රයෙන් විදහා දක්වන්න

(ලකුණු 07)

ඇ. පූර්ණ තරගකාරීවෙළඳපොල ව්‍යුහයක් තුල ක්‍රියාත්මක වන ආයතනයක කෙටිකාලීන සැපයුම් වක්‍රය ව්‍යුත්පන්න කර ගන්නා ආකාරය සුදුසු ප්‍රස්ථාර සටහන් යොදා ගනිමින් කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 05)

(මුළු ලකුණු 20)

ප්‍රශ්න අංක 03

අ. ඒකාධිකාරී වෙළඳපොලක ලක්ෂණ ඒකාධිකාරී තරඟ වෙළඳපොලක ලක්ෂණ සමග සන්සන්දනය කර වෙළඳපොල ව්‍යුහයන් තුල දිගුකාලීනව හා කෙටිකාලීනව ලාභ තීරණය වන ආකාරය දක්වන්න.

(ලකුණු 07)

ආ. එක්තරා ආයතනයක ඉල්ලුම් හා මුළු පිරිවැය ශ්‍රිතයන් පහත පරිදි වේ.

$P = 400+3Q$

$TC = 50+ 2Q^2$

i) ආයතනයේ ලාභ උපරිම වන මිල හා නිමැවුම තීරණය කරන්න.

ii) ලාභය කොපමණද යන්න ගණනය කරන්න.

(ලකුණු 06)

ඇ. "කතිපයාධිකාරී වෙළඳපොලක දක්නට ලැබෙන මිල නායකත්ව ආකෘතියේදී පූර්ණ කරගකාරී වෙළඳපොලක දක්නට ලැබෙන මිල ගනුවකුගේ හැසිරීමට සමානව, අනුගාමික ආයතන විසින් නායකත්ව ආයතනය තීරණයකරන මිල අනුගමනය කරයි". මෙම ප්‍රකාශය සත්‍යද ? අසත්‍යද? කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 07)

(මුළු ලකුණු 20)

## III කොටස

### ප්‍රශ්න අංක 04

අ. කිසියම් ආර්ථිකයක් මත පහත දැක්වෙන තොරතුරු ඔබට ලබා දෙනු ලැබේ. (වටිනාකම් රුපියල් මිලියන වලිනි.)

$C = 100 + 0.8y$ (පාරිභෝජනය)

$Tx = 25 + 0.2y$ (බදු සමීකරණය)

$I = 150$ (ආයෝජනය)

$G = 300$ (රාජ්‍ය වියදම්)

$X = 100$ (අපනයන)

$m = 60 + 0.14y$ (ආනයන)

I. සමතුලිතතා ජාතික ආදායම ලබා දී ඇති තොරතුරු භාවිතා කරමින් ගණනය කර එය රූප සටහනක් මගින් දක්වන්න.

(ලකුණු 06)

II. ආන්තික පරිභෝජනය නැමියාව මගින් මනිනු ලබන්නේ කුමක් ද?

(ලකුණු 02)

III. පාරිභෝජනයට අනුරූප වන නිශ්චිත ඉතුරුම් සමීකරණය ලියන්න.

(ලකුණු 02)

IV. ගුණකය මගින් අදහස් කරන්නේ කුමක්ද? මෙම ආර්ථිකයේ වියදම් ගුණකය ගණනය කරන්න.

(ලකුණු 03)

V. ආනයන ශ්‍රිතය $50 + 0.14y$ ලෙස වෙනස්වන විට සමතුලිත නිමැවුම් වලට සිදුවන්නේ කුමක්ද?

(ලකුණු 04)

ආ. මුල්‍ය වෙළෙඳපොළ තුළ තැන්පත් කරන ලද ගෘහස්ථ ඉතිරි කිරීම් නැවත වියදම වෙත ගෙන එන්නේ කෙසේද යන්න පැහැදිලි කරන්න.

(ලකුණු 03)

(මුළු ලකුණු 20)

<u>ප්‍රශ්න අංක 05</u>

අ. පහත දැක්වෙන ව්‍යුහාත්මක සමීකරණ මගින් ආර්ථිකයේ ලක්ෂණ විස්තර කර ඇති බව සිතන්න.

$C = 160 + 0.6 (Y - T)$ $I = 150$; $G = 150$; $T = 100$.

I. සමතුලිත නිමැවුම් මට්ටම තීරණය කරන්න.

(ලකුණු 05)

II. රජයේ වියදම් (G ) 200 දක්වා ඉහළ නැංවෙනම්, එහි ප්‍රතිපලයක් ලෙස නව සමතුලිත නිමවුම් මට්ටම කොපමණ ද?

(ලකුණු 04)

ආ. IS-LM ආකෘතියෙන් අදහස් කරන්නේ කුමක්ද?

(ලකුණු 03)

ඇ. මුදල් සඳහා වන චේතනා තුන කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 03)

ඈ. 'සම්භාව්‍ය පරාසයට වඩා කේන්සියානු පරාසය තුළ මූර්ත ප්‍රතිපත්තිය වඩා ඵලදායී වේ.' මෙම ප්‍රකාශය සමග ඔබ එකඟද? කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 05)

(මුළු ලකුණු 20)

<u>ප්‍රශ්න අංක 06</u>

අ. "ආර්ථික විචල්‍යයන් අතර සබඳතා අවබෝධ කර ගැනීම සඳහා සූක්ෂම හා සාර්ව ආර්ථික විශ්ලේෂණයන්, ස්ථිතික හා ගතික ආර්ථික විශ්ලේෂණයන් හා සමානවම වැදගත් වේ ." උදාහරණ සමඟ මෙය පැහැදිලි කරන්න.

(ලකුණු 10)

ආ. "සාමාන්‍යයෙන් උද්ධමනය ආර්ථිකය සඳහා දැවැන්තම ගැටලු නිර්මානය කරන ප්‍රධාන සාර්ව ආර්ථික සංසිද්ධිය වේ." ඉහත ප්‍රකාශය විවේචනාත්මකව අගයන්න.

(ලකුණු 10)

(මුළු ලකුණු 20)